මගේ අංකය
எனது இல.
My Number 02/ASI/2023/II

ඔබේ අංකය
உமது இல.
Your Number

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
தொகைமதிப்பு மற்றும் புள்ளிவிபரத் திணைக்களம்
Department of Census and Statistics

දිනය
திகதி
Date 2024.02.27


ප්‍රිය මහත්මයාණෙනි/ මහත්මියණි,

## වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය - 2023

පසුගිය වසර කිහිපය තුල කර්මාන්ත සමීක්ෂණය සඳහා දත්ත සැපයීමෙන් ඔබ විසින් දක්වන ලද සහයෝගයට බෙහෙවින් ස්තූතිවන්ත වෙමි.

2. අප දෙපාර්තමේන්තුව විසින් මෙම දත්ත එක්රැස් කරනු ලබන්නේ, කාර්මික නිෂ්පාදන පිළිබඳ වාර්ෂික වාර්තා සකස් කිරීම, කර්මාන්ත අංශයට අදාල දර්ශකාංක සකස් කිරීම සහ කර්මාන්ත සංවර්ධනයට අදාළ රජයේ ප්‍රතිපත්ති සම්පාදනය කරන්නන් හට අවශ්‍ය තොරතුරු සැපයීම යන මූලික කාරණා සඳහායි.

3. සංඛ්‍යාලේඛන ආඥාපනත යටතේ එක් රැස් කරනු ලබන මෙම තොරතුරු ආයතන මට්ටමින් කිසිවිටෙකත් නිකුත් නොකරන අතර ඒවායේ රහස්‍යභාවය දෙපාර්තමේන්තුව මඟින් ආරක්ෂා කරන බවද අවධාරණය කරමි.

4. ප්‍රශ්නාවලියේ පිටපත් මේ සමඟ ඔබ වෙත එවනු ලබන අතර තවදුරටත් පහත වෙබ් ලිපිනය මගින්ද ප්‍රශ්නාවලිය බා ගත කරගත හැකිය.
http://www.statistics.gov.lk/Industry/StaticalInformation/OngoingSurveyDocuments/ASI

5. මෙම ප්‍රශ්නාවලිය සම්පූර්ණ කොට 2024.03.31 දිනට පෙර industrysurvey@statistics.gov.lk යන විද්‍යුත් ලිපිනයට ලැබෙන්නට සලස්වන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. අදාළ දත්ත සැපයීමේ දී ඔබට යම් පැහැදිලි කිරීමක් හෝ සහායක් අවශ්‍ය වන්නේ නම් කරුණාකර දුරකථන අංක 011- 2147065 මගින් කර්මාන්ත, ඉදිකිරීම්, වෙළඳ හා සේවා අංශයේ අංශ ප්‍රධානී හෝ 0112147403 මගින් විෂය භාර සංඛ්‍යාලේඛනඥ අමතන්න .

5. අවශ්‍ය දත්ත සැපයීමෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සළකමි.

ස්තූතියි.

විශ්වාසී,

.......................................

ඩී.ඩී.ජී.ඒ සෙනෙවිරත්න
අධ්‍යක්ෂ ජනරාල්